**ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනය - 2022**

**-----------------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ජාතික නවෝත්පාදන නියෝජ්‍යායතනයේ ("නියෝජ්‍යායතනය") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

නියෝජ්‍යායතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, නියෝජ්‍යායතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය නියෝජ්‍යායතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා නියෝජ්‍යායතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

නියෝජ්‍යායතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, නියෝජ්‍යායතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් නියෝජ්‍යායතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නියෝජ්‍යායතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ නියෝජ්‍යායතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නියෝජ්‍යායතනය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික ජන රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 104 | 2022 වර්ෂය සඳහා සිදුකර තිබූ භාණ්ඩ සමීක්ෂණයේ වාර්තාවට අනුව එක් ලැප්ටොප් පරිගණකයක් හා යකඩ පුටුවක ඌණතාවයක් දක්වා තිබුණද එයට හේතු සඳහන් කර නොතිබුණු අතර එම නැතිවීම් සම්බන්ධ මුදල් රෙගුලාසි 104 පරිදි කටයුතු කර නොතිබුණි. | එම ඌනතාවයන් 2018 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව මඟින් අනාවරණය වූ අතර ඊට අදාළ පැහැදිලි කිරීම් 2021.02.22 දින අමාත්‍යාංශයේ ගිණුම් අංශය වෙත ලබා දී ඇත. | මුදල් රෙගුලාසි 104 හි විධිවිධාන ප්‍රකාරව නැතිවූ භාණ්ඩ සම්බන්ධයෙන් ආයතනික මට්ටමින් අදාල පරීක්ෂණ කටයුතු සිදු කළ යුතුය. |
| (ආ) 2021 නොවැම්බර් 16 දිනැති 2021/01 අංක සහිත මුදල් අමාත්‍යාංශයේ පොදු ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 6.6 වගන්තිය | වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් මූල්‍ය ප්‍රකාශන කට්ටලය සමඟ ඉදිරිපත්කර නොතිබුණි. | 2022 වර්ෂය ආයතනය මෙහෙයුම් ආරම්භ කළ ප්‍රථම වර්ෂය යි. එම වර්ෂය තුළ දී ආයතනය ස්ථිර ලෙස ස්ථාපනය කිරීම සම්බන්ධ පරිපාලන කටයුතු කෙරෙහි දැඩි අවධානයක් යොමු කිරීමට සිදු විය. ආයතනයේ පාලනයෙන් පරිබාහිර එම කටයුතු, එම වර්ෂයේ රට තුළ පැවැති ව්‍යාකූල තත්ත්වය හේතුවෙන් අධික ලෙස ප්‍රමාද විය. | මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමේදී ඒ සමඟ වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක්ද ඉදිරිපත් කළ යුතුය. |

**1.6 මුදල් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහාභාණ්ඩාගාරය විසින් ජාතික නවෝත්පාදන නියෝජ්‍යාතනය වෙත | 2022.12.31 දිනට මුදල්පොතේ ශේෂය රු. 3,200,022 වන අතර | අවශ්‍යතාවයක් නොමැතිව හෝ අවශ්‍යතාවය |

| | | |
|---|---|---|
| 2022 වර්ෂය වෙනුවෙන් රු. 12,863,900 ක් පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් වෙනුවෙන් ලබාදී තිබුණි. එම ප්‍රතිපාදන වලින් රු. 11,151,186 ක් 2022 දෙසැම්බර් 31 දින වන විට වැය කර තිබුනද පනතේ සඳහන් අරමුණු ඉටු කර ගැනීම සඳහා සුදුසු පසුබිමක් මෙතෙක් සකස් කර නොතිබුණි. | ඉන් රු. 1,905,000 ක් ප්‍රාග්ධන වියදම් සඳහා ලබා දෙන ලද අක්මුදල් ඉතිරි වීමය. ප්‍රාග්ධන වියදම් සඳහා ලබා දෙන ලද අක්මුදල් රු. මිලියන 2 ක මුදල ආයතනයට ලබා දී ඇත්තේ 2022.11.28 වන දින දී ය. එවිට ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදු කිරීමට ප්‍රමාණවත් කාලයක් නොමැති වූ බැවින් එම අක්මුදල් ප්‍රමාණයෙන් රු. 1,905,000 ක් ඉතිරි වී ඇත. එම මුදල් 2023 වර්ෂයේදී උපයෝජනය කෙරෙමින් පවතී. | ඉටුකරගත නොහැකි නම් අදාල මුදල් භාර නොගැනීම සුදුසුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 6,598,340 ක අතිරික්තයක් විය. නියෝජ්‍යායතනයේ සමාලෝචිත වර්ෂයට අදාල ආදායම රු. 17,749,527 ක් වූ අතර එය රු. 12,863,900 ක භාණ්ඩාගාර ප්‍රදාන සහ රු. 4,885,627 ක වත්කම් ප්‍රදානවලින් සමන්විත වී තිබුණි. මෙම ආදායමෙන් රු. 9,218,495 ක වැටුප්, වේතන හා අධ්‍යක්ෂ මණ්ඩල දීමනාද, රු. 543,533 ක් ගිවිසුම්ගත සේවා සඳහාද, රු. 1,148,525 ක් ක්ෂය වීම් සඳහාද වැය කර තිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නිපුණතා සංවර්ධන වෘත්තීය පුහුණු නව නිපැයුම් පිළිබඳ අමාත්‍යාංශය විසින් විද්‍යා තාක්ෂණ නවෝත්පාදන සම්බන්ධීකරණ ලේකම් කාර්යාලය (COSTI) සතුව පැවති පිරිවැය රු. 4,885,627 ක් වූ මූල්‍ය නොවන වත්කම් 2022 ජනවාරි 01 දින නියෝජ්‍යාතනය ලබා දී තිබූණි. ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය 17 ක් වන අතර තත්‍යකාර්ය මණ්ඩලය 11 දෙනෙක් විය. ආයතනයේ කාර්ය මණ්ඩලයට සාපේක්ෂව අතිරික්ත ලැප්ටොප් පරිගණක, ඩෙස්ක්ටොප් පරිගණක හා පුටු පවතින බවද ඒවා ඌණ උපයෝජිතව පවතින බවද නිරීක්ෂණය විය. | ඉදිරියෙදි 41 කින් හෝ ඊට වැඩි සංඛ්‍යාවකින් සමන්විත කාර්යය මණ්ඩලයක් අනුමත කරවා ගැනීමට නියෝජිතායතනය අපේක්ෂා කරයි. ඒ අනුව ඇතිවන පුරප්පාඩු සඳහා බඳවා ගනු ලබන නිලධාරීන්ට ලබා දීමට සිදුවන්නේ දැනට පවතින ගෘහ භාණ්ඩ ම වනු ඇත.<br>බාහිර පුද්ගලයන් හා නව්‍යකරණ ක්‍රියාවලියේ නියුතු වන්නන් නිතර පැමිණෙන ආයතනයක් බැවින්, ඒ අය සමග රැස්වීම්, සාකච්ඡා ආදිය පැවැත්වීම සඳහා පුටු ආදිය භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.<br>එබැවින්, COSTI සතුව පැවැති ගෘහභාණ්ඩ අතිරික්තයක් ලෙස හා ඌන-උපයෝජිතව පවතී යැයි සැලකීම සාවද්‍ය වේ. | පාවිච්චි නොකරන භාණ්ඩ ඵලදායි කටයුතු වලට යොදා ගැනීම |